**සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණයදෙන සමිතිය**

චක්‍රලේඛ අංක : EDCS/GM/Covid/චක්‍රලේඛ/2020/11/02

2020.10.31

සියළුම නි/සාමාන්‍යාධිකාරීන්, ස/සමාන්‍යාධිකාරීන්, පරිපාලන නිළධාරීන්, ස/ගණකාධිකාරීන්, කලාප කළමණාකරුවන්, කළමණාකරන සහකරුවන් වෙත.

**සාමජිකයින් වෙත විශේෂ ණය සහන ලබා දීම**

2020.10.27 දින රැස්වු සමිතියේ ගරු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමිතියේ ණය ලබා දීමේදී මේ වන විට පවත්වාගෙන යනු ලබන ණය කොන්දේසි (දේපල ණය හැර) 2020.10.31 දින සිට 2020.11.30 දින දක්වා පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමටත් මසක් තුල ඇති වන තත්වය සමාලෝචනය කර ඒ සම්බන්ධව නැවත තීරණ ගැනීමටත් තීරණය කර ඇත.

**01 . ණය පොදු කොන්දේසි**

කාරක නියෝග මාලාවේ 7.4 ණය සඳහා පොදු කොන්දේසි (අ) සුදුසුකම් 01 එම ආකාරයෙන්ම ක්‍රියාත්මක කිරීම. "දේපල ණය හැරුණු විට අනෙකුත් සියලුම ණය සඳහා සාමාජිකත්වය ලබා අවම වශයෙන් මාස 06 ක් තිබිය යුතුය ". ණය ඉල්ලුම් කරන මාසයට පෙර මාස 02 ක් වත් ගිණුම සක්‍රීය වී තිබිය යුතුය.

**02 . ක්ෂණික ණය කොන්දේසි**

ක්ෂණික ණය වාරික 02 ක් අය වීමෙන් පසු නැවත ණය ලබා දීමට එසේ ණය ලබා දීමේ දී හිගව ඇති ණය ශේෂය අදාල පොලිය ලබා දෙන ණය මුදලින් හිලව් කිරීම.

**03 .ඇපකර ණය කොන්දේසි**

1. මේ වන විට ලබා දෙනු ලබන රු.1,000,000/- (ලක්ෂ දහය) රු. ලක්ෂ පහලොව (රු.1,500,000/-) දක්වා වැඩි කිරීම
2. ඇපකර ණය හිග ශේෂය සහ පොලිය ගෙවා අවසන් කර ඇති අයට නැවත ණය ලබා දීමට
3. ඇපකර ණය ගෙවා නැවත ණය ලබා දීමටත් එසේ ලබා දීමේදී හිග ණය ශේෂය හා පොලිය ලබා දෙන ණය මුදලින් හිලව් කිරීමට
4. සාමාජිකයින් වානිජ බැංකු වලින් ලබා ගෙන ඇති ගුරු සෙත ඇතුලු අනෙකුත් ණය සමිතියේ මගින් ඉල්ලුම් කර අනුමත ණය මුදලින් ගෙවීම් කිරීමටත්

**04 .භාණ්ඩ ණය කොන්දේසි**

1. මේ වන විට ලබා දෙනු ලබන භාණ්ඩ ණය මුදල රු. ලක්ෂ පහ (රු.500,000/-) රු. ලක්ෂ දහය(රු.1,000,000/-) දක්වා වැඩි කිරීම
2. භාණ්ඩ ණය ගිවිසුම් පත්‍රය ණය ඉල්ලුම් පත්‍රය සමගම ලබා දී අයදුම් පත්‍රය සමග භාර ගෙන ණය ලබා දීමට

3. ආපසු අය කර ගැනීමේ කාලය මාස 48 සිට මාස 72 දක්වා වැඩි කිරීමටත්

**05 .දේපළ ඇපකර ණය කොන්දේසි**

1. දේපල ඇපකර ණය ලබා ගෙන ඇති ණය කරුවන්ට අය වී ඇති මුදල ඇතුලුව 40% අවකරණ සීමාව තුල ලබා දිය හැකි උපරිම ණය මුදල ලබා දීමටත් හිගව ඇති මුදල ලබා දෙන ණය මුදලින් පියවා ගැනීමටත් එසේ ගෙවීමෙදී පවතින ගිවිසුම් සංශෝධනය කර ගැනීම ඇතුලු අනෙකුත් සියලුම නීතිමය පියවරයන් අනුගමනය කිරීමටත්
2. වාහන මිලදී ගැනීම සඳහා දේපල ඇපකර ණය ලබා දීමටත්

**සැලකිය යුතු කරුණු**

✓ ඉහත ණය කොන්දේසි සාමාජිකයින් දැනුවත් කිරිම සඳහා දිස්ත්‍රික් කාර්යාලය තුල ප්‍රදර්ශනය කිරීමට පියවර ගන්න.

✓ මේ වන විට සමිතියේ ණය ඉල්ලුම අඩු වීම හා ණය ආපසු ගෙවීම වැඩි වීම සම්බන්ධව ඔබගේ අවධානය යොමු කර ඒ සම්බන්ධව සියලුම කාර්යය මණ්ඩලය දැනුවත් කර මේ වන විට ලබා දෙන ක්ෂණික ණය ඉතා කෙටි කාලයක් තුල ලබා දීමටත් භාණ්ඩ ණය ඉල්ලුම් පත් බාර ගෙන පැය දෙක තුනක් ඇතුලත අඩුපාඩු දැනුවත් කර අඩුපාඩු නොමැති ගොනු සඳහා එදිනම ණය ලබා දීමට හැකි වන පරිදි කටයුතු සංවිධානය කර ගැනීමට සියලුම සහකාර සාමාන්‍යාධිකාරිවරුන් විසින් කටයුතු කල යුතු බව දන්වමි.

මෙයට

සාමාන්‍යාධිකාරි (වැ.බ)

පිටපත්

1. ගරු සභාපතිතුමා/ලේකම්තුමා - දැ.පි.
2. ගරු උප සභාපතිතුමා/උප ලේකම්තුමා - දැ.පි
3. ගරු පලාත් අධ්‍යක්ෂතුමා - දැ.පි
4. නි/සාමාන්‍යාධිකාරි(මුදල්) - දැ.පි.
5. ගණකාධිකාරි - දැ.පි.
6. නි/සාමාන්‍යාධිකාරි (ණය) - දැ.පි. හා අ.ක.ස.
7. අභ්‍යන්තර විගණන - අ.ක.ස.
8. ගොනුවට